E-Journal of Social Work 2019 - 3 (1): 38-48

4

# AN ANALYSIS ON CHANGES OF FAMILY FUNCTIONS AND HUMAN RELATIONSHIP PATTERNS IN MODERN SRI LANKAN SOCIETY

# නූතන ශ්‍රී ලංකා සමාජය තුළ පවුලේ කෘත්‍යයන් හා මානව සම්බන්ධතා රටාවන්ගේ වෙනස්වීම පිළිබඳ විශ්ලේෂණයක්

**B.A.Niluka Wijebandara**

*M.A (Sociology) University of Kelaniya, PG Dip. (Psychology and Counselling) University of Colombo, BA, University of Sri Jayawardenapura.*

*Research Officer, Social Development, Policy Research and Publications Division, National Institute of Social Development*

**Abstract:** Human family is a major factor which decides the existence of each society. It is a universal concept. Primary socialization is happened through family. Also person exist his existancy at the society based on family functions. As a small organization in social structure, family supports to fulfill human physical, mental, social and materialistic needs. Family can be chanted timewise due to norms and values. Family has existing mission on it. When comparing previous Sri Lankan society, it is obvious that there are no specific changes in family functions. Therefore, this focuses to identify the family, its functions and the way human relationships change in Sri Lankan society.

**Key words: Human family, Socialization, Social institution, Functionalism, Social Solidarity**

**සංක්ෂේපයඃ** සමාජයක පැවැත්ම තීරණය කරනු ලබන ප්‍රධානම සාධකය මානව පවුලයි. එය විශ්වීය සංකල්පයකි. ප්‍රථම සමාජානුයෝජනය පවුල තුළින් ලබන පුද්ගලයෙකු පසුව පවුලේ කාර්යභාරයන් ප්‍රමුඛ කොට ගනිමින් සමාජය තුළ තම පැවැත්ම තහවුරු කර ගනු ලබයි. සමාජ ව්‍යුහයේ කුඩාම සංවිධානාත්මක ඒකකය ද පවුල වේ. එහෙත් පවුල කුඩාම සමාජ ඒකකය වුවත් එයට සමාජය තුළ හිමිවනුයේ ඉතා වැදගත් ස්ථානයකි. එයට හේතුවනුයේ පුද්ගලයින්ගේ කායික, මානසික, සමාජයීය හා භෞතික අවශ්‍යතා සපුරා ගැනීමට පවුල දායක වන බැවිනි. පවුල නැමති සමාජ සංස්ථාව කලින් කලට වෙනස් වන්නේ ඒවාට ඇති සාරධර්ම හා ධර්මතාවන්ගේ වෙනස්වීම හේතුවෙන්ය. පවුල් සංස්ථාවට ද එයට ආවේණික වූ මෙහෙවරක් ඇත. එනම් පවුලේ කෘත්‍යයන් පවුලේ මෙහෙවරයි. නමුත් අතීතය හා වර්තමානය යන දිශානතීන් තුළ පවුලේ කෘත්‍යයන් ද ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ විවිධ වෙනස්වීම්වලට භාජනය වී ඇති බව ප්‍රත්‍යක්ෂ වේ. ඒ අනුව මානව පවුල හඳුනාගැනීමත් පවුලේ කෘත්‍යයන් හා ශ්‍රී ලාංකික සමාජය තුළ මානව සම්බන්ධතා රටාවන් වෙනස් වී ඇති ආකාරය හඳුනා ගැනීමත් මෙහි අරමුණ වේ.

**ප්‍රමුඛ පද : මානව පවුල, සමාජානුයෝජනය, සමාජ සංස්ථා, කෘත්‍යවාදය, සමාජ ඒකාබද්ධතාවය**

**හැඳින්වීම**

කෘත්‍යවාදීන්ට අනුව සමාජය පද්ධතියක් ලෙස සංස්ථා රාශියකින් හා උප පද්ධති රාශියකින් ගොඩනැගී ඇත. ඒ අතරින් පවුල් සංස්ථාව ප්‍රමුඛකොට සැලකිය හැක. මෙලොව උපත ලබන සෑම ජීවියකුම මුල්ම සාමාජිකත්වය ලබා ගනුයේ තම පවුල තුළිනි. පවුලක් යනු පුද්ගලයන් සමූහයක් නොව පුද්ගලයන් සමූහයක් යම් කාර්යභාරයක් සඳහා සංවිධානය කොට මෙහෙයවනු ලබන සාරධර්ම හා ධර්මතාවන්ගේ සංවිධානයකි. ඒ සාරධර්ම හා ධර්මතාවලට අනුව කටයුතු කරන්නෝ එම පවුලේ සාමාජිකයන්ය. ඒ අනුව පවුල යනු පුද්ගලයන් නොව සංගෘහිත සාරධර්ම හා ධර්මතාවයන්ගේ සංයුතියකි. සමාජයේ ජීවත්වන සෑම පුද්ගලයකුම අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා හා බැඳී පවතී. නමුත් බටහිර සමාජයේ සිදුවූ කාර්මික විප්ලවය ප්‍රංශ විප්ලවය ආදී හේතූන් හා ඒ නිසා ඇති නාගරීකරණය, කාර්මිකරණය, නවීකරණය හේතුවෙන් සමාජයේ සිදු වූ වෙනස්වීම පවුල් සංස්ථාවේ ව්‍යුහය හා ක්‍රියාකාරීත්වය ද වෙනසකට ලක්කොට තිබේ. එතෙක් පැවති විස්තෘත පවුල් ඒකකය න්‍යෂ්ටික පවුල් ඒකකයක් දක්වා වෙනස් විය. 20 වන සියවසේ ලංකාවේ ඇති වූ දේශපාලන, අධ්‍යාපන, සමාජීය හා සංස්කෘතික විපර්යාසයනුත්, විවෘත ආර්ථිකයේ බලපෑමත් නිසා මෙරට සමාජ ක්‍රමය ද විශාල වෙනසකට පරිවර්තනය විය. නිෂ්පාදන පරිභෝජන ඒකකයක්ව පැවති පවුලේ කෘත්‍යයන් ද සංකීර්ණ විය. එපමණක් නොව පවුලේ සාමාජිකයන් අතර පැවති සම්බන්ධතා රටාවන්ගේ ද වෙනසියාවක් ඇතිවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සාම්ප්‍රදායිකව පැවති පවුලේ කෘත්‍යයන් ද විවිධ වෙනස්වීම්වලට ලක්විය. ඒ අනුව ශ්‍රී ලාංකික පවුල් සංස්ථාව තුළ පවුලේ කෘත්‍යයන් හා එහි වෙනස්වීම පිළිබඳ විශ්ලේෂණාත්මක විමසා බැලීම කාලෝචිත වේ.

**මානව පවුල අර්ථ දැක්වීම**

මානව පවුල අර්ථ දැක්වීමේ දී ඒ සඳහා විශ්වීය නිර්වචනයක් ඉදිරිපත් කළ නොහැකි බව විවිධ සමාජ හා මානව විද්‍යාඥයින් ඉදිරිපත් කරන ලද නිර්වචන පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පැහැදිලිවන කරුණකි.

විවාහක යුවල සහ ඔවුන්ගෙන් බිහි වූ දරුවන්ගෙන් යුත් සමාජ ඒකකය මානව පවුල ලෙස ඇතැම්හු අර්ථ විවරණය කරති. ඥාතීත්වයේ පදනම වන්නේ ද පවුලයි. මෙකී සියලු තත්ත්වයන් ඇසුරු කර ගනිමින් පවුල යනු කුමක් ද යන්න මෙසේ විග්‍රහ කර තිබේ. ඒ අනුව මානව පවුල වශයෙන් හැඳින්වෙන්නේ සාපේක්ෂව ස්ථිර යැයි කිව හැකි දෙදෙනෙකුට වඩා වැඩි ගනනකින් යුත්, එක්කෝ නෑකමකින්, විවාහයෙන් හෝ නීතියෙන් දරුකමට හදා ගැනීමෙන් එකිනෙකා සම්බන්ද වූ එකට ජීවත්වන ආර්ථික වශයෙන් එක් වූ සමූහයකි. එමෙන්ම ස්වාමිපුරුෂයා, භාර්යාව ඔවුන්ගෙන් ඇතිවන දරුවන් හෝ හදාවඩා ගන්නා ලද දරුවන් සහිත මානව ඒකකය මානව පවුල වශයෙන් ද හඳුන්වා දී තිබේ (පතිරත්න,2003: 39).

කැත්ලින් ගොග් විසින් රචිත The Origin of the Family ග්‍රන්ථයට අනුව පවුල යනු දරුවන් හදාවඩා ගැනීමේදීත් හා ආර්ථිකමය කටයුතු වලදීත් සහයෝගීව ක්‍රියා කරන්නා වූ, සාමාජිකයන් සියල්ලන්ම හෝ වැඩිහිටි දෙදෙනෙකු පොදු ගෘහයක් තුළ ජීවත් වන්නා වූ විවාහක යුවලක් හෝ පිරිපුන් වයසැති ඥාතීන් පිරිසකි (ගොග්, 1989 : 2). ඒ අනුව අඹුසැමි යුවළක් සිටීම මෙන්ම ඔවුන්ට දරුවන් සිටීම ද ආර්ථික කටයුතුවලදී හා දරුවන් හදාවඩා ගැනීමේ දී පවුලක සාමාජිකයන් සහයෝගයෙන් කටයුතු කිරීම පවුලක් හඳුනා ගැනීමේ දී වැදගත් වන බව පැහැදිලි වේ.

"බර්ගස් සහ ලොක්" (Burgess and Lock) 1953 දී 'පවුල' (The family) නමින් කෘතියක් රචනා කරමින් පවුල පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් කර තිබේ. එනම් වෛවාහික හෝ රුධිරමය හෝ කෘතිම හෝ බන්ධනයන්ගෙන් ඒකීභූත වූ එක ගෘහයක වාසය කරන ස්වාමියා සහ භාර්යාව, මව හා පියා, සොහොයුරා සහ සොහොයුරි, දුව පුතා යනුවෙන් තම තමන්ට ආවේණික තත්ත්වයන් යටතේ අන්තර් ක්‍රියාවන් හා අන්තර් සන්නිවේදනයන් පවත්වමින් පොදු සංස්කෘතියක් නිර්මාණය කරන්නා වූ පුද්ගල සමූහය පවුල නම් වේ (Rao, 1999: 393) .

මෙම නිර්වචනය තුළ කරුණු කිහිපයක් අවධාරණය කරනු ලබයි. එනම්

i. පවුලක් නිර්මාණය වීමට අවශ්‍ය කාරණා තුනක් පිළිබඳව අදහස් දක්වා ඇත.
   a. වෛවාහික බන්ධනය
   b. රුධිරමය බන්ධනය
   c. කෘතිම (අරන්හදා ගැනීමේ) බන්ධනය

   මෙම බැඳීම් තුනෙන් එකකින්වත් ස්වාමියා හා භාර්යාව, දෙමව්පියන් හා දරුවන් බැඳී සිටිය යුතුය

ii. පවුලේ සාමාජිකයන් එක නිවෙසක නැතහොත් එක වහලක් යට වාසය කළ යුතුය
iii. පවුලේ සාමාජිකයන් ඔවුන්ට හිමිව ඇති තත්ත්වයන්ට අනුව එකිනෙකා සමඟ අන්තර් ක්‍රියාවන් හා අන්තර් සන්නිවේදනයක් පවත්වයි.
iv. පවුල තුළ පොදු සංස්කෘතියක් නිර්මාණය වේ.
v. පවුල කුඩා සමාජ සමූහයකි.

සාමාජිකයන් දෙදෙනෙකු හෝ ඊට වඩා වැඩි ගණනක් ඔවුන් ජීවත්වන සමාජය පිළිගන්නා වූ විවාහයකින්, ලේ වලින් හෝ දරුකමට හදාවඩා ගැනීමකින් හෝ බැඳී කිසියම් දිගු කාල පරිච්ඡේදයක් තුළ එකට ජීවත් වෙමින් තමන්ගෙන් පැවැත එන්නන්ගේ රැකවරණය සලසන සමූහය පවුල නම් වේ (Benkin, 1981:184).

ජෝර්ජ් පීටර් මර්ඩොක් නම් ඇමෙරිකානු මානව විද්‍යාඥයා සමාජ වර්ග 250කට වඩා අධ්‍යයනය කරමින් පවුල තුළින් ඉටුවන කෘත්‍යයන් පදනම් කොටගත් අර්ථ කථනයක් “Social Structure (1949)” නම් කෘතියෙහි දක්වා ඇත.

පොදු පදිංචිය, ආර්ථික සහයෝගය, ලිංගික ප්‍රජනනය තුළින් එකට බැඳුන ලිංග දෙකකට අයත් වැඩිමහලු අය එකට වෙසෙන, ඉන් දෙදෙනෙක් සමාජ සම්මත ලිංගික සම්බන්ධතා පැවැත්වීමෙන් ජාතක කළ (බිහි කළ) හෝ දරුකමට හදා වඩා ගත් දරුවකු හෝ දරුවන්ගෙන් යුත් සමාජ සමූහය පවුල නම් වේ (කුමාර උපුටා ගන්නේ Robertson, 2001: 57-58) .

ජී.පී. මර්ඩොක්ට අනුව ඔහු ප්‍රධාන පවුල් වර්ග තුනක් පිළිබඳ විග්‍රහ කරයි. එනම් න්‍යෂ්ටික පවුල (Nuclear Family), විස්තාරිත පවුල් (Extended Family), බහු වෛවාහක පවුල් (Polygamous Family) ලෙසය.

ස්වාමිපුරුෂයා හා භාර්යාව ඇතුළු ඔවුන්ට දාව උපන් ළමයින් මෙන්ම ඇතැම්විට අරන් හදාගත් දරුවන් ද න්‍යෂ්ඨික පවුලට අයත් වේ. වර්තමානයේ සමාජය තුළ බහුල වශයෙන් දැකගත හැක්කේ මෙම පවුල් ක්‍රමය වන අතර ස්වාමියා, බිරිඳ හා දරුවන් එකම නිවසක වාසය කිරීම මෙහි පොදු ලක්ෂණයයි. සෑම පුද්ගලයෙක්ම විවාහයෙන් අනතුරුව න්‍යෂ්ටික පවුල් දෙකකට අයත් වේ. එනම් දිශානති පවුල හා ප්‍රජනක පවුලයි.

විස්තාරිත පවුල් ලෙස හඳුනාගනුයේ න්‍යෂ්ටික පවුල් දෙකකට වැඩි ගණනක් දෙමව්පියන් දරුවන් වශයෙන් එක නිවසක ජීවත් වීමයි. මුලිකවම සලකතොත් ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික පවුල විස්තෘත පවුලක් වූ අතර ස්වාමියා බිරිඳ හා සිය දරුවන්ට අමතරව පිය පස හෝ මව් පස ඥාතීන් කිහිප දෙනෙකුටම රැකවරණය ලබාදුන් ඒකකයක් විය. නුර්යාල්මන්, එස්.ජේ. තම්බයියා වැනි මානව විද්‍යාඥයන්ගේ අධ්‍යයනයන්ට අනුව සිංහල සමාජ සංවිධානය නම් ග්‍රන්ථයේ රැල්ප් පීරිස්ගේ උඩරට පවුල පිළිබඳ හැඳින්වීමෙන් ද ඒ බැව් පැහැදිලි වේ (අමරසේකර, 1996:70). මෙම පවුල තුළ පරම්පරා තුනක් පමණ එකට වාසය කරන අතර පවුලේ අවධානය වෘද්ධ පරම්පරාව සහ බාල පරම්පරාව යන දෙකොට්ඨාසයටම යොමුවේ.


බහු වෛවාහක පවුල් දෙයාකාර වේ. එනම් බහු පුරුෂ පවුල් ක්‍රමය (Polyandry) හා බහු ස්ත්‍රී පවුල් (Polygyny) වේ. බහු පුරුෂ පවුල් ක්‍රමයෙහිදි එක් කාන්තාවක් ස්වාමිපුරුෂයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් සමඟ පවුල් ජීවිතය ගෙන යන අතර බහු ස්ත්‍රී පවුල් ක්‍රමයේ දී එක් පුරුෂයකු

කාන්තාවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් සමග පවුල් ජීවිතය ගෙන යයි. බහු පුරුෂ විවාහ ක්‍රමය ශ්‍රී ලාංකේය සමාජයේ කන්ද උඩරට පළාත්වල දක්නට ලැබුණි. බහු ස්ත්‍රී විවාහ ක්‍රමය ඇතැම් ආසියාතික හා මැදපෙරදිග රටවල දක්නට ලැබේ (පෙරේරා, 2014:90).

### පවුල් ඒකකයේ වැදගත්කම

මානව පවුල හා එහි කාර්යභාරයන් පිළිබඳ සාකච්ඡා කිරීමේ දී පවුල් ඒකකයේ වැදගත්කම පිළිබඳ විමසා බැලීම ඉතා අත්‍යාවශ්‍ය වේ. පවුලේ සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය සබඳතාවය මනාව ගොඩනගා ගැනීමෙන් පවුලේ කාර්යභාරයන් ඉටුකර ගැනීම වඩාත් පහසුවේ. පවුලක් තුළින් පවුලේ සාමාජිකයන්ගේ කායික, මානසික, සමාජයීය හා භෞතික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හැකියාව ලැබෙන අතර එය පහත රූප සටහන මගින් අවබෝධ කර ගත හැකිය.

**රූප සටහන 01, පවුලේ අවශ්‍යතා සපුරාලීම**




මුලාශ්‍රය - www.e-thaksalawa.moe.gov.lk

උක්ත රූප සටහනින් පැහැදිලි වන්නේ ශාකයක් වර්ධනය වීමට ආහාර, ජලය, උෂ්ණත්වය හා හිරුඑළිය ප්‍රමාණාත්මකව ශාකයේ මූලයට ලැබීමෙන් එහි මුල් ශක්තිමත් වී මලින්, ඵලින් බර ශාකයක් ලෙස වර්ධනය වන්නාසේ පවුල නැමති ශාකය සශ්‍රීක වන්නේ පවුලේ සාමාජිකයන්ගේ මූලික අවශ්‍යතා එනම් කායික අවශ්‍යතා, මානසික අවශ්‍යතා, සමාජයීය අවශ්‍යතා හා භෞතික අවශ්‍යතා නිසි පරිදි සපුරාලීමෙනි.

### මානව පවුලේ කෘත්‍යයන්

පවුල නැමති සමාජ සංස්ථාව සමාජ ක්‍රියාවලියේ දී මූලික කෘත්‍යයන් රාශියක් ඉටු කරයි. විවිධ සමාජ විද්‍යාඥයින් විසින් පවුල තුළින් ඉටුවන ජීව විද්‍යාත්මක හා සමාජයීය කාර්යයන් රැසක් පෙන්වා දී ඇති අතර ඒ අතරින් ඉතා සුවිශේෂී වන්නේ ජී.පී. මර්ඩොක් නම් සමාජ මානව විද්‍යාඥයා විසින් රචිත සමාජ ව්‍යුහය නැමති කෘතියේ පවුල් සංස්ථාවක් සතු සුවිශේෂි කාර්යභාරයන් හතරය. එනම්,

1. පොදු වාසය (Common Residence)
2. ආර්ථික සහයෝගීතාව (Economic Cooperation)
3. ලිංගික හා ප්‍රජනනය (Sexual Reproduction)
4. අධ්‍යාපනය සහ සමාජානුයෝජනය (Education & Socialization) වේ.

**පොදු වාසය**

බිරිඳ, සැමියා හා ඔවුනොවුන්ගෙන් යැපෙන දරුවන් භූගෝලීය වශයෙන් එකම නිවසක හෝ එකම වාසස්ථානයක වාසය කිරීම පොදු වාසය වේ. සැමියා හා බිරිඳ අතර කායික ලිංගික හා භාවමය සම්බන්ධතාව ගොඩනැගෙන ප්‍රබල ම සාධකය පොදු වාසස්ථානයයි. එසේම දෙමාපියන් හා දරුවන් අතර සහෝදර සහෝදරියන් අතරත් භාවමය හා ස්නේහමය බැඳීම සඳහා පොදු වාසස්ථාන අත්‍යාවශ්‍යමය. එසේම පවුලේ සාමාජිකයන්ට උණුසුම, සංතෝෂය, මිත්‍රශීලීත්වය, විනෝදය යනාදී චිත්තවේගී කාර්යයන්හී දී පවුල් සංස්ථාව ඉතා වැදගත් වන්නේ පවුලෙන් පිටස්තර සාමාජිකයන් සමග අන්තර් ක්‍රියාවල යෙදීමේ දී චිත්තවේගීය අන්තර් ක්‍රියාවල යෙදීමට ඇති ඉඩකඩ සීමාසහිත බැවිනි. ඒ අනුව මිනිසාගේ ස්වභාවික චිත්තවේගී පදනම කරගත් හැසිරීම ප්‍රකාශ වීමට සාපේක්ෂව වැඩි ඉඩකඩක් පුද්ගලයා අයත්වන පවුල තුළ දී ඔහුට ලැබේ. මේනිසා පවුලක් තුළ ඊට අයත් සියලු සාමාජිකයන් පොදුවේ පදිංචිව සිටීම ඔවුන්ගේ කායික හා මානසික පෝෂණයට ද හේතු වේ (Danziger, 1971: 191).

නෛතික හා චාරිත්‍ර මත පදනම් වූ විවාහය මානව පවුලේ පොදු වාසය ඇති කිරීමේ පදනම ද වේ. එසේම පවුල් සමූහයේ ස්ථාපිතභාවය ආරක්ෂා වන ප්‍රධාන සාධකය ලෙස ස්වකීය ගෘහ වාසිකය තුළ රැඳීම දැක්විය හැක.

සාම්ප්‍රදායික විස්තෘත පවුල් ක්‍රමය තුළ මෙම පොදු වාසය කැපී පෙනුණ අතර පුළුල් වූ ඥාතී සම්බන්ධතා ජාලයක් ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සමාජයේ පොදු වාසස්ථානයක ජීවත් වීම පවුලේ ශක්තිමත්භාවය රැඳීමට ඉවහල් විය. දරුවන් ඇති දැඩි කිරීම, ඔවුන්ට අවැසි භෞතික සහ මානසික දියුණුව ඇති කර ගැනීමට ද පොදු වාසය බෙහෙවින් වැදගත් වේ.

නමුත් නූතන සංකීර්ණ සමාජයේ විවිධ සමාජ, ආර්ථික, අධ්‍යාපනික සාධක පදනම් කරගනිමින් දෙමාපියන් දරුවන් පොදුවාසයෙන් බැහැර වීමක් දක්නට හැකි අතර එය පවුලේ සාමාජිකයන් හුදකලා වීමට හේතුවක් වී ඇත. එම හේතුවම පවුලේ සාමාජිකයන්ට අහිතකර ප්‍රතිඵල ලබාදීමට හේතුවිය හැකිය. 1977 ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමඟ බටහිර ආසියාව දක්වා සිදු වූ ශ්‍රම සංක්‍රමණ වඩාත් වේගවත් වී තිබේ.

විශේෂයෙන්ම මව පවුල තුළින් බැහැරව මැද පෙරදිග රටවල ගෘහ සේවිකාවක් ලෙස සේවය සඳහා යෑම දරුවන්ගේ පැවැත්ම කෙරෙහි දැඩි නිශේධනාත්මක බලපෑම් ඇති කිරීමට සමත් වී ඇති බව සමාජ විද්‍යාත්මක පර්යේෂණයන්ගෙන් සනාථ වී ඇත. මෙය දරුවන් කෙරෙහි මෙන්ම දෙමව්පියන් කෙරෙහි ද අහිතකර බලපෑමක් කරයි. ලිංගික අතවර, ළමා අපචාර, ළමා අපයෝජන මෙන්ම බාලාපරාධකරුවන් බිහිවීමට ද අනෙක් අතට දෙමාපියන් නැතහොත් වැඩිහිටියන් සඳහා දිනෙන් දින ඉදිවන වැඩිහිටි නිවාස සංඛ්‍යාව වර්ධනය වීමට ද මෙම තත්ත්වය බලපා ඇත. එමෙන්ම බිඳුණු පවුල් (Broken Homes) නැතහොත් දෙමාපියන්ගේ රැකවරණය ආරක්ෂාව අහිමි වූ පවුල් සංඛ්‍යාව ද ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වීමට මෙම තත්ත්වය බලපා තිබේ (දැඩිගමුව, 2012: 82-83).

නූතන සමාජය තුළ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් මව පවුලෙන් ඉවත් වීම පදනම් කරගෙන සිදුවන ළමා අපචාර, අපරාධ විශාල වශයෙන් දැකගත හැකිය. විශේෂයෙන්ම ශ්‍රී ලාංකික සංස්කෘතියට පටහැනි පියා අතින් ගැහැණු දරුවන් ලිංගික අතවරවලට ලක්වීම වැනි ඛේදනීය සිදුවීම් ද වාර්තා වූ වාර ගණන අපමණය. වර්තමාන දෛනික පුවත්පත් වාර්තා විශ්ලේෂණය කිරීමේ දී හඳුනාගත හැකි කාරණයක් වන්නේ දෙමාපියන් ගෘහයෙන් බැහැරවීම පොදුවාසය බිඳවැටීමට හේතු වී ඇති බවයි.

**ආර්ථික සහයෝගීතාව**

පවුලේ කාර්යයන් අතර ඉතා වැදගත් කාර්යයක් වශයෙන් ආර්ථික සහයෝගීතාවය හඳුනාගත හැක. එයට හේතු වන්නේ පවුල ස්ථාවරව පවත්වා ගැනීමට ආර්ථික වශයෙන් ස්ථාවර පදනමක් තිබිය යුතු වීමයි. ප්‍රාථමික සමාජ පිළිබඳ අදහස් දැක්වූ මානව විද්‍යාඥයන් ආර්ථික සහයෝගීතාවයේ දී ලිංගික ශ්‍රම විභජනය ඉතා වැදගත් බව පෙන්වා දී ඇත. විශේෂයෙන්ම සාම්ප්‍රදායික සමාජය තුළ පුරුෂයා ප්‍රධාන ආර්ථික කටයුතු එනම් ගොවිතැන, දඩයම් කිරීම, මසුන් ඇල්ලීම වැනි කාර්යයන්හි නියුක්ත

වූ අතර කාන්තාව නිවෙස තුළ රැඳෙමින් ගෘහ පාලනය, දරුවන් හදාවඩා ගැනීමේ කාර්යයන්වල නිරත විය. මේ තත්ත්වය යටතේ ලිංගිකත්වය හා වයස මත පදනම් වූ ශ්‍රම විභජනය දක්නට ලැබීම සුවිශේෂී වේ.

පවුල් ව්‍යුහයන් සතුවූ ආර්ථික සහයෝගීතාව ඊ.ආර්.ලීච් (E.R. Leach) පුල්එළිය (Pul-Eliya) කෘතියෙන් අවධාරණය කරයි. ලීච්ගේ අර්ථකථනයට අනුව කෘෂිකාර්මික කටයුතු සඳහා එකල ශ්‍රම ආයෝජනය ලබා දීමට කයිය නැමති සංවිධානාත්මක ශ්‍රම හුවමාරු ක්‍රමයක් පැවති බව අනාවරණය කරයි.

නමුත් වර්තමාන සංකීර්ණ සමාජය තුළ පවතින ආර්ථික ප්‍රවාහයට මුහුණ දීම සඳහා ස්වාමියා හා බිරිඳ යන දෙදෙනාම රැකියාවන්හි නියුක්ත වීම දක්නට ලැබේ. ඒ අනුව වර්තමාන සමාජයේ පවතින ආර්ථික අවශ්‍යතා, අධ්‍යාපන සුදුසුකම් හා අර්ථ ක්‍රමයේ ස්වභාවය ආදී කාරණා ශ්‍රම විභජනය සඳහා බලපා ඇත.

**ලිංගික හා ප්‍රජනන කාර්යය**

ජීව විද්‍යාත්මක සංසිද්ධියක් ලෙස සිදුවන ලිංගික සම්බන්ධතාවයේ ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයෙකු ජනිත වන අතර මානව සමාජය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ලිංගික හා ප්‍රජනන කෘත්‍ය ප්‍රබල සාධකයක් වේ. එනම් පවුලකට නව සාමාජිකයන් එකතුවීම සිදුවනුයේ මෙම ලිංගික කෘත්‍යය මගිනි. නමුත් පුද්ගලයකු තුළ ඇතිවන ලිංගික ප්‍රේරණයන් අවිචාරවත්ව හා ආවේගාත්මකව ඉටුකර ගැනීමට ගැටලුකාරී තත්ත්වයක් බැවින් ඒ සඳහා විවාහයෙන් සංස්ථාපිත වන පවුල නැමති විශ්වීය ආයතනය මගින් ස්ත්‍රියගේ සහ පුරුෂයාගේ ලිංගික සම්බන්ධතා සඳහා අවැසි නීතිමය පදනමක් සපයා ඇත.

ලිංගික හා ප්‍රජනන කාර්ය සිදු නොවීම පවුල් සංස්ථාවේ දෙදරා යෑමට ද බලපාන බව සමාජ විද්‍යාඥයින්ගේ අදහස වන අතර එම කාර්යය පවුල තුළට පමණක් සීමා විය යුතු අතර එසේ නොවුන කල විවිධ සමාජ ගැටලු නිර්මාණය විය හැක.

**අධ්‍යාපනය සහ සමාජානුයෝජනය**

අධ්‍යාපනය සහ සමාජානුයෝජනය ද පවුලේ කෘත්‍යයන් අතර වැදගත් වේ. අධ්‍යාපනය සහ සමාජානුයෝජනය යන දෙඅංශයෙන්ම සිදුවනුයේ එකම ක්‍රියාවලියකි. එනම් පුද්ගලයාගේ චර්යාවේ පාලනයත්, හික්මීමත්, ශික්ෂණයත්, සම්මත බවක් කිසියම් රටාවක් ඇති කිරීමය. පවුල සමාජයට නව සාමාජිකයන් ජනිත කරන ආයතනයක් පමණක් නොව දරුවන් සමාජයට ගැලපෙන සහ ප්‍රයෝජනවත් ආකාරයට අනුයෝජනය කරන ආයතනයක් ද වේ. පැරණි සමාජයේ මෙන්ම නූතන සමාජයේ ද ළමයෙකුගේ සමාජානුයෝජනයේ දී කේන්ද්‍රීය සමාජ ආයතනයක් ලෙස පවුල ක්‍රියා කරයි. සමාජ හා මනෝවිද්‍යාඥයින්ට අනුව සමාජානුයෝජනය ප්‍රධාන කොටස් දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. එනම් ප්‍රාථමික සමාජානුයෝජනය (Primary Socialization) සහ ද්විතියික සමාජානුයෝජනයයි (Secondary Socialization). දරුවකු මෙලොව උපත ලබා මුල්වරට සමාජය හා තම අවට පරිසරය පිළිබඳව වැටහීමක් ලබනුයේ පවුල තුළිනි. එය ප්‍රාථමික සමාජානුයෝජනය වන අතර ද්විතියික සමාජානුයෝජනය ලබා ගනුයේ පාසල තුළිනි (පෙර පාසලට හා විශ්වවිද්‍යාලය යනාදී විවිධ අධ්‍යාපන ආයතනය ද ඇතුළුව). ද්විතියික සමාජානුයෝජන කාරකයක් ලෙස පාසල ක්‍රියා කළත් ළමයාගේ පාසලේ වැඩ, විනෝදාංශ, ගෙදර වැඩ යනාදියට උදව්වීම හා ඒවා අගය කිරීම මගින් ප්‍රාථමික සමාජානුයෝජන කාරකයක් ලෙස පවුල තුළින් ඉටුවන කාර්යභාරය ළමයා පාසලට ඇතුළත් වීමෙන් පසු ද නොනවතින බව පෙනී යයි (කුමාර, 2001: 68).

නමුත් නූතනයේ අධ්‍යාපන කෘත්‍ය මානව පවුලෙන් පරිබාහිර සුවිශේෂි ආයතන වටා කේන්ද්‍රගත වී ඇති අතර ආර්ථික නිෂ්පාදනය නිවසේ සිට නිෂ්පාදනාගාරයට මාරු වීම තුළ පවුලට අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීම සඳහා මුදල් ඉපයිය යුතුවිය. නූතන සංකීර්ණ සමාජයේ න්‍යෂ්ටික පවුල ඒකකය තුළ මව සහ පියා යන දෙදෙනාම රැකියාවල නිරතවන හෙයින් දරුවාට අධ්‍යාපනය ලබා දෙන්නේ

විධිමත් අධ්‍යාපන ආයතන මගිනි. එනම් පාසල, කාර්මික විද්‍යාල, විශ්වවිද්‍යාල වැනි විධිමත් අධ්‍යාපන ආයතන විසිනි.

මේ අනුව මර්ඩොක් විසින් දක් වූ පවුල තුළින් ඉටුවන විශ්වීය කෘත්‍යයන්ගෙන් පොදු වාසස්ථානය හා ජීව විද්‍යාත්මක ප්‍රජනන කෘත්‍ය ඉටු නොවුණහොත් සමාජය පවත්වාගෙන යාමට නොහැකිය. ආර්ථික සහයෝගීතාව හා අධ්‍යාපන කෘත්‍ය බිඳ වැටුණහොත් සංස්කෘතියක් නොමැති වේ. ඒ අනුව සමාජය හා සංස්කෘතිය අතර ඇති අවියෝජනීය බැඳීම පවත්වාගෙන යාමට මානව පවුල වැදගත් වේ.

මර්ඩොක් විසින් ඉදිරිපත් කළ පවුලේ ප්‍රධාන කෘත්‍යයන් හතරට අමතරව මැක් අයිවර් (Mac Iver) පවුලක කෘත්‍යයන් ප්‍රධාන කොටස් දෙකකට බෙදයි. එනම්

1. අත්‍යවශ්‍ය කෘත්‍යයන් (Essential functions)
2. අත්‍යවශ්‍ය නොවන කෘත්‍යයන් වශයෙනි. (Non - essential functions)

මැක් අයිවර්ට අනුව අත්‍යවශ්‍ය කෘත්‍යයන්ට අඩංගු වන්නේ පවුල මගින් ඉටුවන ලබන ප්‍රාථමික කෘත්‍යයන්ය. එනම්

1. ලිංගික අවශ්‍යතාව සමාජය පිළිගත් පරිදි ඉටුකර දීම
2. නිෂ්පාදනය
3. දරුවන් බිහි කිරීම හා ඔවුන් නඩත්තු කිරීම
4. ගෘහ වාසිකයේ ජීවත් වීම යනාදියයි (Rao, 1999:395).

අත්‍යාවශ්‍ය නොවන කෘත්‍යයන් ලෙස ඔහු දක්වනුයේ පවුල මගින් ඉටුවන ද්විතීයික කෘත්‍යයන්ය. ඒවා නම්,

1. ආගමික කෘත්‍යය
2. අධ්‍යාපනික කෘත්‍යය
3. වින්දනාත්මක කෘත්‍යය
4. සෞඛ්‍ය - නිරෝගිත්වය යනාදියයි.

කිංස්ලි ඩේවිස්ට (Kingsley Devis) අනුව පවුල මගින් ප්‍රධාන කෘත්‍යයන් හතරක් ඉටුවේ.

1. ලිංගික ප්‍රජනනය - දරුවන් උත්පාදනය (Reproduction)
2. පවුලේ සාමාජිකයන්ගේ නඩත්තුව (Maintenance)
3. දරුවන් ස්ථානගත කිරීම (Placement)
4. සමාජානුයෝජනය (Socialization)

මෙහිදී දරුවන් ස්ථානගත කිරීම යන්නෙන් අදහස් කරන්නේ දරුවන්ට වැඩිහිටියන් ලෙස සිය ජීවිතය පවත්වාගෙන යාමට රැකියාවක් නැත්නම් ආදායම් මාර්ගයක් සඳහා පහසුකම් සැපයීමයි. කුල ක්‍රමයක් සහිත සමාජවල පියාගේ කුල රැකියාව දරුවන්ට පුරුදු පුහුණු කිරීම දක්නට ලැබුණි.

මීට අමතරව ඔග්බර්න් සහ නිම්කොෆ් දක්වන අන්දමට පවුල ඒකකය තුළින් ප්‍රධාන කෘත්‍යයන් හයක් ඉටුවන බව දක්වයි (Rao, 1999:395) .

1. අනුවේදනාත්මක කෘත්‍යය (ආදරය, සෙනෙහස) (Affectional function)
2. ආර්ථික කෘත්‍යය (Economic function)
3. වින්දනාත්මක කෘත්‍යය (Recreational function)
4. ආරක්ෂණ කෘත්‍යය (Protective function)
5. ආගමික කෘත්‍යය (Religious function)
6. අධ්‍යාපන කෘත්‍යය (Education function)

**නූතන පවුලේ කෘත්‍යයන්ගේ වෙනස්වීම**

නූතනයේ කාර්මික සමාජය තුළ පවුලේ කෘත්‍යයන් හි වෙනස්කම්, නවීකරණය වීම මෙන්ම ඇතැම් කෘත්‍යයන් පවුලෙන් ඉවත්ව යාම (functions lost or modified) සිදු වෙමින් පවතී. විසිවෙනි සියවසේ අග භාගය වනවිට විවෘත ආර්ථිකයේ හා ගෝලියකරණයේ ප්‍රතිඵලයක් ලෙස මෙරට සාම්ප්‍රදායිකව පැවති විස්තාරිත පවුල් න්‍යෂ්ටික පවුල් ක්‍රමය දක්වා විපරිවර්තනය වී ඇත. පවුල් සංස්ථාවේ ව්‍යුහය තුළ දක්නට ලැබෙන මෙම වෙනස්වීම පවුලේ කාර්යභාරයන් වෙනස් කිරීමට ද ප්‍රබල බලපෑමක් සිදුකර ඇත.

පවුල් සංස්ථාවේ ස්ථිර පැවැත්මටත්, සාමාජිකයන් අතර සමීප සම්බන්ධතාවයක් ඇතිකර ගැනීමටත් පොදු වාසස්ථානයක ජීවත් වීම ඉතා වැදගත්ය. අතීතයේ විස්තාරිත පවුල් ක්‍රමය තුළ පවුලේ සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය වශයෙන් විශාල බැඳීමක් තිබූ අතර එමගින් දූ දරුවන්ට අවැසි සෙනෙහස ආරක්ෂාව නොඅඩුව ලැබුණ අතර කුඩා දරුවන්ට හා වැඩිහිටියන්ට අවශ්‍ය රැකවරණය ආදරය පවුල තුළින්ම ලැබුණි.

නමුත් වර්තමාන සමාජය තුළ වැඩිහිටියන් රැකබලා ගැනීම දෛනිකව වර්ධනය වන අතර එය සමාජ අර්බුදයක් බවට පත්ව ඇත. වර්තමානය වනවිට දරුවන් හා වැඩිහිටියන් රැකබලා ගැනීම වෙනත් පාර්ශවයන්ට පැවරී ඇති අතර නවීන සමාජයේ දරුවන් හා වැඩිහිටියන් රැකබලා ගැනීම දිවා සුරැකුම් මධ්‍යස්ථාන වෙත පැවරී ඇත.

නූතන සමාජ වෙනස්වීම යටතේ විතත පවුල බිඳවැටී ඒ වෙනුවට මූලික වී ඇත්තේ දරුවන් හා දෙමව්පියන්ගෙන් පමණක් සැදුණු න්‍යෂ්ටික පවුල හෙවත් මූලික පවුලයි. මෙම වෙනස්වීම පදනම් කරගෙන පවුල සහ දරුවා අතර පැවතිය යුතු විධිමත් සමාජානුයෝජනය පරිපාටිය බිඳවැටීම, බිඳුණු පවුල් වැඩිවීම, පවුලේ පදිංචිය හා ව්‍යුහය සාම්ප්‍රදායික තත්ත්වයෙන් ඉක්මගොස් නව්‍ය වාසික හෙවත් නව පෙදෙසක අලුතින් ගොඩනැගුණු දක්නට ලැබේ. සමාජය වේගයෙන් නවීකරණය වීමත් සමග පරිසරය ද ප්‍රධාන වශයෙන් වෙනස්වීමට ලක්වේ. එහි ප්‍රතිඵලයක් ලෙස පරිසරය තුළ ඇති පවුල ද එහි සාමාජිකයන්ගේ පෞරුෂයන් ද වෙනස් වේ.

න්‍යෂ්ටික පවුල් සංස්ථාව තුළ සිටින සාමාජිකයන් සංඛ්‍යාව සීමාවීම ද සමාජයට අහිතකර ආකාරයේ බලපෑම් ඇතිවීමට හේතු වේ. පැරණි සමාජය තුළ කෘෂිකාර්මික ජීවන රටාව ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රබල ඒකකයක් වූ අතර ඒ සඳහා අවශ්‍ය ශ්‍රමය ලැබුණේ ද පවුලේ සාමාජිකයන්ගෙනි. එහෙත් වර්තමාන න්‍යෂ්ටික පවුල් සංස්ථාව තුළ එකිනෙකා වෙන්කර ගත් කාර්යභාරයක් දක්නට හැකිය. මෙම වාතාවරණය තුළ පවුලේ සාමාජිකයන් අතර පවතින සම්බන්ධතා ද බොහෝ දුරස් වී ඇත.

නවීන සමාජය වඩා සංකීර්ණ වීම තුළ මව්පියන් දෙදෙනාම රැකියාවන් සඳහා යොමු වී ඇත. නූතන අධ්‍යාපන තරගය හේතුවෙන් කාන්තාවන්ගේ සංස්කෘතිමය සුදුසුකම් ද ඉහළට ගමන් කර ඇති අතර ඒ නිසා ඔවුහු පිරිමින්ගේ වෘත්තීය ක්ෂේත්‍රවලට යොමුව සිටිති. මේ තත්ත්වය සෘජුවම මෑත යුගයේ බුද්ධිමත් කාන්තා කොටස්වලට විශාල බලපෑමක් සිදුකර ඇති අතර ඒ පිරිසේ අධිකතාව නිසා දුර බැහැර දුෂ්කර ප්‍රදේශවලට පවා ගොස් නියමිත කාර්ය කොටස් ඉටු කිරීමට සංවිධානය වී සිටිති. එහෙයින් මව්පියන් හා දරුවන් එකට ගත කරන කාලය ද සීමා වී ඇති අතර දරුවන්ට ලැබිය යුතු ආදරය, රැකවරණය ද ක්‍රම ක්‍රමයෙන් ගිලිහී යාමට පටන් ගෙන ඇත. මේනිසා සමාජය තුළ පැවති චර්යා ධර්ම, ආකල්ප හා වටිනාකම් ද සීඝ්‍ර වෙනස්වීමකට ලක් වී ඇත. දෙමව්පියන්ගේ කාර්යබහුලත්වය මත මවගේ හා පියාගේ කාර්ය කොටස ගෘහ සේවිකාවකට හෝ පවුලෙන් පිටත වෙනත් පාර්ශවයකට පැවරී තිබේ. පවුලේ සියලු සාමාජිකයන් පොදු වාසස්ථානයක ජීවත්වීම එම පවුල් සංස්ථාවේ සුරක්ෂිතභාවයට ඉතා වැදගත්ය. එහෙත් වර්තමාන පවුල් සංස්ථාව තුළ මෙම තත්ත්වය ද වෙනස්වීමට ලක්ව ඇත.

විශේෂයෙන්ම පියා රැකියාව සඳහා වැඩි වේලාවක් යොමු කිරීම තුළ ඔහුට විශාල මුදලක් ඉපයීමට හැකිවුව ද ඔහුගේ කුටුම්භය සංරක්ෂණය වීමට අවශ්‍ය තවත් වටිනා යමක් ඔහු වෙතින් ගිලිහී යනු

ලබයි. එනම් බිරිය සහ දරුවන් සමග ගත කළ යුතු කාලය හා එකිනෙකාගෙන් ලබන චිත්තවේගී පෝෂණයන්ය. එය නොලබන නාගරික දරුවෝ රූපවාහිනිය වැනි අජීවී මෙවලම් නැත්නම් වටිනා සෙල්ලම් බඩු සමග වැඩි වේලාවක් ගත කරයි. සමාජ විද්‍යාඥයන් පෙන්වා දෙන්නේ පවුල තුළ උපයෝගි නායකත්වය දරන්නේ පියා බවත්, වින්දනාත්මක නායකත්වය දරන්නේ මව බවත්ය. (අමරසේකර, 1996: 72) මවද විදෙස් රැකියාවක හෝ දුර බැහැර රැකියාවක නියැලි ඇත්නම් මේ තත්ත්වය වඩාත් තීව්‍ර වේ.

පවතින ආර්ථික තත්ත්වයන් මත රැකියාව කේන්ද්‍රකොටගෙන දෙමව්පියන් හා දරුවන් යන දෙපාර්ශවයම පදිංචිය සඳහා සුවිශේෂී ස්ථාන සොයන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශ දක්වා සංක්‍රමණය වීම ද අද බහුලව දක්නට හැක. එසේම තමාගේ ශ්‍රමය වුවමනා ගුණයෙන් හා වුවමනා ප්‍රමාණයෙන් අලෙවි කර ගැනීමට ඇති හැකියාව ද මෙයට බලපානු ලබයි. නාගරික යාන්ත්‍රීකරණය වේගයෙන් ගම් මට්ටමට ව්‍යාප්ත වන්නට වන්නට ගමෙන් නගරයට තල්ලුකිරීමත්, නගරයෙන් නගරයට ඇද ගැනීමත් කරනු ලැබේ. සමාජ විද්‍යාඥයන් එය හඳුන්වන්නේ ඇද ගැනීමේ හා තල්ලු කිරීමේ සාධක ලෙසයි. (Pull Factor & Push Factor) කෙසේ වුවද මෙසේ මුල් ගම් බිම් අතහැර වෙන්වයාමෙන් තමාගේ පවුල ගැන පමණක් සිතන්නට පොළඹවන තත්ත්වයක් ඇති කරතියි කිව හැකිය. මහගෙදර, නෑ හිතවතුන් ආදීන් අතහැර වෙනත් පරිසරයක නව පවුලක් ගොඩනගා ගන්නා ඔහු ගත තුළ පවතින අවශේෂ සංස්කෘතික අගනාකම් හා සබඳතාවන් ගෙන්ද ක්‍රමයෙන් වෙන් වෙයි. නොඑසේ නම් ඒ ගැන සිතීමට ඔහුට අවකාශ ඇති නොවෙයි. (අමරසේකර, 1996: 73) මේ හේතුන් මත දෙමාපියන් හා දරුවන් අතර ඇති සම්බන්ධතාවයේ ද බිඳ වැටීමක් දක්නට ලැබෙන අතර බොහෝවිට වර්තමානයේ දරුවන්ගේ ජීවිතයේ වැදගත් තීරණ දරුවන් විසින්ම ගන්නා තත්ත්වයකට පත්ව ඇත. උදාහරණ වශයෙන් විවාහය පෙන්වා දිය හැක. මෙම වැරදි තීරණ ඔවුන්ගේ ජීවිත දෙදරා යාමට, අතහැරයාම, දික්කසාදය වැනි සමාජ ප්‍රශ්න රාශියක් උද්ගත වීමට හේතු වී ඇත.

තවද නූතන පවුල් සංස්ථාව තුළ ඥාතී සම්බන්ධතා පැවැත්වීම ඉතා අවම අගයක් ගන්නා අතර සාම්ප්‍රදායික සමාජයේ විස්තාරිත පවුල තුළ මෙම ඥාති සම්බන්ධතා ඉතා ඉහල මට්ටමක පැවතිණ. පවුලේ ආර්ථික මට්ටම ශක්තිමත්වීමට, පවුල තුළ සහයෝගය සහ සමගිය වර්ධනය වීමට, එසේම භෞතික සංවර්ධනය සහ ආධ්‍යාත්මක සංවර්ධනය වර්ධනයට එය මනා පිටුබලයක් විය. එහෙත් නූතන සමාජයේ ඥාති සම්බන්ධතා අවම වී මිත්‍ර සම්බන්ධතා ගොඩනැගීම බහුල වී ඇත.

වර්තමාන සමාජ ආර්ථික රටාව තුළ පවතින තරගකාරීත්වය හා සංකීර්ණත්වය හමුවේ කාන්තාව ද පුරුෂයාට සමානවම රැකියාවන්ට යොමුවීම මත කාන්තාවට සමාජය තුළ විවිධ අපයෝජනයන් හා කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියා බහුලව සිදුවේ. එපමණක් නොව විවාහක පවුල් අභ්‍යන්තරයේ ද විවිධ ගැටුම් ඇතිවීම දක්නට ලැබේ.

වර්තමානය වනවිට දැකගත හැකි තවත් කරුණක් වනුයේ පවුලක මව විදේශගත වීම නිසා පවුල තුළ ඇති වන ගැටලුකාරී තත්ත්වයන්ය. මවගේ සියලු කාර්ය කොටස් පියාට සිදුකළ නොහැකි අතර එහි ප්‍රතිඵලයක් ලෙස පවුලේ දරුවනට ආදරය, සෙනෙහස, රැකවරණය නොලැබෙන අතර දරුවන් විවිධ අපරාධකාරි චර්යාවන්ට යොමුවීම, අපයෝජන හා අපචාරයන්ට යොමුවීම වර්තමාන සමාජය තුල බහුලව දක්නට ලැබේ.

පවුල සතු වු ලිංගික කාර්යය නූතන කාර්මික සමාජයෙහි බෙහෙවින් වෙනස් වෙමින් පවතී. මේ සමාජවල අදවන විට පූර්ව-වෛවාහක හා පරි-වෛවාහක ලිංගික සම්බන්ධතා (pre-marital sex and extra-marital sex) පැවැත්වීම සීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇත. ඒ අනුව, කාර්මික සමාජවල ලිංගික සම්බන්ධතා පවුලට පමණක් අනන්‍ය වු වරප්‍රසාදයක් ලෙස තවදුරටත් නොසැලකේ. නව තාක්‍ෂණික නිපැයුම්, නාගරීකරණය, කාර්මිකරණය යනාදිය නිසා පුද්ගලයා පවුල සමග පැවති ග්‍රහණය බොහෝ දුරට ලිහිල් වෙමින් පැවතීම ඊට ප්‍රධාන හේතුවයි. නූතන සාමාජිකයන් ආගමික අදහස්වලින් මිදී ජීවිතයේ ලෞකික පාර්ශවයට වැඩි නැඹුරුවක් දැක්වීම ද පූර්ව වෛවාහක කාලය දීර්ඝ වීම ද මීට හේතු ලෙස සැලකිය හැක. (කුමාර, 2008: 285)

උක්ත සාකච්ඡා කළ පරිදි ලිංගික ප්‍රජනනය පවුලක ඉතා වැදගත් කෘත්‍යයකි. සාම්ප්‍රදායික ජන සමාජයේ විස්තාරිත පවුල තුළ දරුවන් සංඛ්‍යාව ඉතා ඉහල අගයක් ගත් අතර එය පවුලේ ආර්ථික ශක්තිය වැඩිකර ගැනීමට ඉවහල් විය. නමුත් වර්තමාන ශ්‍රී ලාංකික පවුල් ව්‍යුහය තුළ පුංචි පවුල රත්තරන් යන ආකල්පය ඉස්මතුවීම හේතුවෙන් න්‍යෂ්ටික පවුල් ව්‍යුහය තුළ සිටින දරුවන් සංඛ්‍යාව අඩු අගයක් ගෙන ඇත. මෙයට තවත් හේතුවක් වී ඇත්තේ උපත් පාලන ක්‍රම සහ පවුල් සංවිධාන ක්‍රම නූතනයේ වඩාත් ප්‍රචලිත වීමයි.

**සමාලෝචනය**

පූර්වොක්ත කරුණු සමස්තය දෙස විමර්ශනාත්මකව බැලීමේ දී මානව පවුල විශ්වීය සංකල්පයක් ලෙස පෙනී යන අතර ශ්‍රී ලංකාවේ මානව පවුල ද විසිවන සියවසයේ අග භාගයේ සිට ම සීඝ්‍ර පරිවර්ථනයකට හා විවිධ බලවේගයන්ට මුහුණ දෙමින් සිටින බව පැහැදිලි වේ. විශේෂයෙන්ම නවීකරණ ක්‍රියාදාමය හා ඒ සම්බන්ධයෙන් මානව සමාජය තුළ සිදු වු චින්තන වෙනස්වීමත් කාර්මිකරණය නිසා බටහිර සමාජයේ මෙන්ම සෙසු ලෝකයේ ද සමාජ ආර්ථික අංශයෙන් ඇති වු පැහැදිලි වෙනස්වීමත් පවුල යන සමාජ ආයතනයේ බොහෝ අංග ලක්ෂණ කෙරෙහි සැලකිය යුතු බලපෑම් ගණනාවක් එල්ල කර ඇති බව පැහැදිලිව විද්‍යාමාන වේ.

ඒ අනුව ශ්‍රී ලංකාවේ මානව පවුල හා එම පවුලේ කාර්යභාරය ද වෙනස්වීම්වලට ලක් වී ඇති අතර විශේෂයෙන්ම එදා සමාජයේ විස්තෘත පවුල තුල ළමයින්ට මහත් රැකවරණයක් සැපයුනු අතර පිරිමි දරුවෙකු පියා හෝ වැඩිහිටි පුරුෂයකු යටතේ තම කාර්යය භාරය හා භූමිකාව ආරෝපනය කර ගනිමින් සමාජගත වීම ද ගැහැණු දරුවෙකු මව හෝ වැඩිහිටි කාන්තාවක් යටතේ තම කාර්යභාරය හා භූමිකාව ආරෝපණය කර ගනිමින් සමාජ ගත වේ. එසේම දරුවකු තම මූලික සමාජානුයෝජනය තම දෙමව්පියන් හැරුණු විට විස්තෘත පවුලේ වැඩිහිටි පාර්ශවයන්ගෙන් සපුරා ගත්ත ද වර්තමානයේ මෙය බාහිර පාර්ශවයන්ට පැවරී ඇත. මේ අනුව පවුලේ දරුවකු සමාජයට නිරාවරණය වන්නේ ක්‍රමානුකූලව නොව, මේ සඳහා සෘජුවම පවුලේ ව්‍යුහයේ වෙනස්වීම බලපා ඇත. ඒ අනුව සාම්ප්‍රදායික පවුලක් විසින් ඉටු කරනු ලැබූ කාර්ය බොහෝමයක ක්‍රියාත්මක වගකීම ව්‍යාපාරික ස්ථාන, දේශපාලන පක්ෂ සංවිධාන, පාසල්, සුභසාධන ආයතන යනාදිය විසින් පැහැදිලිව හඳුනාගෙන පවුල විසින් කළ කටයුතු ඒවා මගින් ඉටු කිරීම සමගම පවුලේ කාර්යයන් අඩු වී යාමක් සිදුව ඇති බව දක්නට ලැබේ.

එසේ වුවත් ඒ නිසා එයින් පවුලේ වැදගත්කම මුළුමනින්ම ගිලිහී ගිය බවක් නොකියවේ. සමාජ පද්ධතියේ පැවැත්මට අවශ්‍ය වන්නා වු තවත් බොහෝ කටයුතු පවුල මගින් ඉටු කර දීමක් සිදු වෙයි. අනික් අතට පවුල සතුව තිබූ ඇතැම් කාර්ය ඉවත් වීම සමගම ඉතිරි වී ඇති කාර්යභාරයන් සම්බන්ධයෙන් පවුලට වඩාත් ප්‍රමුඛතාවක් දීමට සිදුවීමයි. පවුලින් පිටත දී මිනිසුන් පවත්වන බොහෝ සම්බන්ධතා පවුලක් තුළදී මෙන් ගැඹුරට ගලා ගිය ඒවා නොවේ. පවුල තුළ පවතින්නේ භාව විෂයක බැඳීමකි. එය ඉතා බලවත් හැඟීමකි. මෙය පවුලින් හැර වෙනත් කවර තැනකින්වත් ලබාගත නොහැකි මානසික වින්දනයක් බව සමාජ විද්‍යාඥයෝ පෙන්වා දෙති (එපිවත්තඃ 2006:200).

ඒ අනුව පවුල යනු මව්පිය හා දරුවන් එක්ව සැකසුන සමාජ ඒකකය වේ. පවුල් සංස්ථාව තුළින් ගොඩනැගෙන සමාජය බාහිර සමාජය හා බැඳෙමින් සමාජ සංයුතිය හා එහි ව්‍යුහය මෙන්ම ක්‍රියාකාරීත්වය ද පුළුල් බවට පත් කරයි. එබැවින් පවුල පිළිබඳව හා පවුල පදනම් කරගනිමින් පවුල තුළ උද්ගත වන සුභවාදී හා අසුභවාදී තත්ත්වයන් අවසාන වන්නේ සමාජමය වශයෙන් ද සුභ අසුභ තත්ත්වයනට සාපේක්ෂක සංඝටක රැසක් ඇති කරවමිනි. ඒ අනුව මානව පවුල පිළිබඳ විශේෂ අවධානය යොමුකොට එය සකස් විය යුත්තේ කෙසේ ද යන්න අවබෝධ කරගත යුතුවේ.

මේ අනුව පවුල නැමති ආයතනය මර්ඩොක් නිවැරදිව ප්‍රකාශ කළ පරිදි සමාජයේ පැවැත්මට අවශ්‍යය. පවුල නැමති සමාජ සංස්ථාව මත අනෙකුත් සංස්ථාවන්හී ද රඳා පැවැත්ම තීරණය වන අතර පවුලේ කාර්යභාරයන් විවිධ ආකාරයෙන් වෙනස්වීම්වලට ලක් වුවද තවදුරටත් සමාජයේ අද්විතීය සංස්ථාව වනුයේ පවුල් සංස්ථාවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අමරසේකර, දයා. 1996. *ශ්‍රී ලංකා සමාජය සමාජ විද්‍යාත්මක විමසුමක්.* වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ

එපිටවත්ත, සෙනෙවි. 2006. *සමාජය කියවීම I : සමාජ ස්ථර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගිකත්වය හා පවුල.* පන්නිපිටියඃ සීමාසහිත ස්ටැම්ෆර්ඩ් ලේක් (පෞද්ගලික සමාගම)

කුමාර, එන්.වී.ජී.ඒ හේමන්ත. 2008. *සමාජ විද්‍යාවඃ මූලික සංකල්ප න්‍යාය, හා ක්‍රමවේදය.* පුංචි බොරැල්ලඃ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

කුමාර හේමන්ත එන්.වී.ජී.ඒ. 2001. *පවුල හා විවාහය.* මුල්ලේරියාවඃ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

ගොග්, කැත්ලීන්. කුරේ, උපාලි. (පරි). 1989. *පවුලේ මූලාරම්භය.* දෙහිවල ඃ සංවර්ධන අධ්‍යාපන ප්‍රකාශන.

පතිරත්න, මහේෂ්. 2003. සමාජ විද්‍යා ප්‍රශ්නෝත්තර සංග්‍රහය. කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, බී.ඒ. ටෙනිසන්. 2014. *සමාජ විද්‍යාව හා සමාජ විද්‍යා ප්‍රවේශය.* කඩවතඃ නුවණි ප්‍රින්ටර්ස් - ඇන්ඩ් පබ්ලිෂර්ස්.

පෙරේරා, බී.ඒ. ටෙනිසන්. 2013. *මානව විද්‍යාව සමාජය හා සංස්කෘතිය.* කොළඹ 10ඃ සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

Benkin, Richard L. 1981. *Sociology : A way of seeing*. California: Wadswarth Publishing Company

Daniziger, K. 1971. *Socialization*. England : Penguine Book Ltd.

Rao, C.N. Shanker. 1999. *Sociology*. New Delhi : S. Chand Company

www.e-thaksalawa.moe.gov.lk